දසවන වෙළුම (2024 මැයි - 2024 අගෝස්තු)

A CSR Project by
Sputnik International Sri Lanka Organization (SISLO)

# ස්පුට්නික් බාලිකා නිවාසයේ එදිනෙදා විශේෂ සිදුවීම් වාර්තාව

## (Sputnik Girls' Home Newsletter)



අප ස්පුට්නික් බාලිකා නිවාසයේ යහපත සහ අභිවෘද්ධිය වෙනුවෙන් නිරතුරු කැපවී සිටින ඔබ සැමට අපගේ කෘතඥතාවය පළ කර සිටිමු. අප දියණියන්ගේ වත්මන් තොරතුරු පිළිබඳව දැන ගැනීමට ඔබ සැම කැමැත්තෙන් පසුවනු ඇතැයි සිතමු. එබැවින් “Sputnik Girls' Home Newsletter” හි දසවන වෙළුම තුළින් මෙසේ ඔබ හමුවට පැමිණෙන්නෙමු.


037-562-3155

sputnik.srilanka@gmail.com
www.sputnik-international.org

Sputnik Girls' Home,
Kanumale, Uhumeeya,
Kurunegala.


@manojmalaka

**2024.05.03**

රජරට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවක් වන ජනානි දිව්‍යාංජලී සිසුවිය සීමා වාසික පුහුණුවක් සඳහා ස්පුට්නික් බාලිකා නිවාසය වෙත පැමිණියාය.



**2024.05.07**

කුරුණෑගල ළමා ආරක්ෂණ අධිකාරි නිලධාරිතුමියන් දෙදෙනෙකු පැමිණ අප දැරියන් සමඟ සුහදව කතාකර විනෝද ක්‍රියාකාරකම් කර දැරියන්ගේ ඉදිරි අනාගතය සාර්ථක කරගැනීමට උපදෙස්  ලබාදුනි.





**2024.05.10**

ස්පුට්නික් බාලිකා නිවාසය තුළ ක්‍රියාත්මක වන කාබනික ගොවිපල හා ගැඩවිලි දියර පොහොර නිෂ්පාදනය සාර්ථක ලෙස සිදු කරමින් පවති. එම නිෂ්පාදන ඉදිරියේදී වෙළඳපොළට නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.






@manojmalaka

**2024.05.10**

ස්පුට්නික් බාලිකා නිවාසයේ අවුරුද්දක පමණ කාලයක් සහය පාලිකාතුමිය ලෙස කටයුතු කළ නාලනී අමරා කස්තුරිආරච්චි මහත්මිය අද දින අප අතරින් සමුගත්තාය. එතුමියට අවසන් ගෞරවය දැක්වීමට ස්පුට්නික් බාලිකා නිවාසයේ දැරියන් හා කාර්යමණ්ඩලයද සහභාගි විය.





**2024.05.12**

අප දියණියන් විසින් සිටුවා ඇති වැලි අනෝදා පැල වලට පොහොර යෙදීම ඔවුන් විසින්ම සිදුකරන ලදී.

**2024.05.13**

බාලිකා නිවාස පරිශ්‍රයේ ඉදිකර ඇති වැවෙහි වැව් බැම්ම සකස් කිරීමට අවශ්‍ය පස් එකතු කිරීම අප දියණියන් විසින් සිදු කරන ලදී.





@manojmalaka

**2024.05.14**

වීරඹුගෙදර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා රතු කුරුස සංවිධානය මගින් පවත්වනු ලැබූ ප්‍රථමාධාර වැඩසටහන ස්පුට්නික් බාලිකා නිවාස පරිශ්‍රයේදී පැවැත්වුණි. එම අවස්ථාව සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරි පිරිසක් සහ රතු කුරුස සංවිධානයේ එරංග සම්පත් විජේපාල මහත්මයාද, අප ආයතනයේ සභාපති එශාන්ත ආරියදාස මැතිතුමාද ස්පුට්නික් බාලිකා නිවාසයේ කාර්ය මණ්ඩලයද මෙම අවස්ථාවට සහභාගි විය.







**2024.05.20**

ස්පුට්නික් බාලිකා නිවාසයේ සේවය කර අප අතරින් සමුගත් නාලිනී අමරා කස්තුරිආරච්චි මහත්මියට, ඉන්ද්‍රා වික්‍රමආරච්චි මහත්මියට සහ මියගිය සියලුම කාර්ය මණ්ඩල සේවකයින්ට පින් අනුමෝදනාව සහ වෙසක් පොහොය නිමිති කරගෙන පවත්වන ලද සද්ධර්ම වර්ෂා වැඩසටහන මෙදින පැවැත්වුණි. පූජ්‍ය මැටියගනේ වජිරඤාණ ස්වාමීන් වහන්සේගේ වැඩමවීමෙන් මෙම පිංකම සිදු විය.







@manojmalaka

**2024.05.21**

වෙසක් පොහොය නිමිති කරගෙන අප දියණියන් විසින් ඉතා අලංකාර ලෙස වෙසක් කූඩු නිර්මාණය කරන ලදි.





**2024.05.22**

අප දියණියන් හා පුස්තකාල ළමා සමාජයේ දරු දැරියන් එකතු වී වෙසක් බැති ගී සරණිය හා වෙසක් පත් නිර්මාණය කෙරුණු අතර සභාපතිතුමා පැමිණ එම වෙසක් පත් විනිශ්චය කළේය.





**2024.05.23**

වෙසක් පොහොය දිනයේ ස්පුට්නික් බාලිකා නිවාසය වෙත ආහාර පරිත්‍යාග සිදු කරන ලද නාරම්මල පදිංචි **V. F. A.** ප්‍රනාන්දු මහතා සහ ඔහුගේ පවුලේ සමාජිකයන් විසින් අපගේ දියණියන්ව සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ව චාරිකාවක් සඳහා රැගෙන යන ලදී. මෙහිදී නාරම්මල පිහිටි සීලවතී විහාරය හා මැදගොඩ රජමහා විහාරය වන්දනා කිරීමටත්, එම ප්‍රදේශයේ දන්සැල් වලට සහභාගි වීමටත් අවස්ථාව උදා විය. අපගේ දියණියන්ට සහ කාර්ය මණ්ඩලයට මෙම අවස්ථාව ලබා දුන් ඔබ සියලු දෙනාට බොහොම ස්තුතියි.





@manojmalaka

**2024.06.02**

අප බාලිකා නිවාසයේ පවත්වාගෙන යන පුස්තකාල ළමා සමාජය මෙම මාසයේදීද පැවැත්වුණි. එම සමිතිය අතර තුරදී වෙසක් උත්සවයට සමගාමීව පැවැත්වූ වෙසක් පත් නිර්මාණ තරඟාවලියෙන් ජයග්‍රහණය කළ දරුවන්ට ත්‍යාග පිරිනැමීම සිදු විය. තවද අප දියණියන්ගේ නර්ථන, ගායන හා රංගන දක්ෂතාද ඉදිරිපත් කර පැමිණි සිටි සියලු දෙනා පිනවීය. පුස්තකාල ළමා සමාජය සෑම මසකම පළමු වන ඉරිදා දින පැවැත්වේ.





**2024.06.08**

වෛද්‍ය තාරක සමන්ත බාලසූරිය හා වෛද්‍ය ප්‍රිතිකා බාලසූරිය යන වෛද්‍යවරුන් දෙදෙනා ස්පුට්නික් බාලිකා නිවාසයට පැමිණ සෑම සෙනසුරාදා දිනකම යෝගා වැඩ සටහනක් පවත්වයි.





**2024.06.09**

ස්පුට්නික් බාලිකා නිවාස පුස්තකාලයේ පරිහරණය සඳහා තුෂාර ධර්මදාස මහතා විසින් වටිනා පොත් පරිත්‍යාගයක් සිදු කළේය.






@manojmalaka

**2024.06.16**

ස්පුට්නික් බාලිකා නිවාසය වෙත පරිත්‍යාග සිදු කරන දිනේෂ් බංඩාර මහතා විසින් සංවිධානය කරන ලද චාරිකාවට අප දියණියන් සහ කාර්යමණ්ඩලය සහභාගි විය. යාපහුව බලකොටුව, අවුකන බුද්ධ ප්‍රතිමාව සහ රැස්වෙහෙර විහාරයද දැකබලා වන්දනා කර ගැනීමට මෙමගින් අවස්ථාව උදා විය.

**2024.07.01**

බාලිකා නිවාස පරිශයේ ඇති වගා භූමියට ජලය සපයන ජල මූලාශ්‍රය අවට පුවක් පැළ වගාවක් අප දියණියන් විසින් ආරම්භ කරන ලදී.

**2024.07.04**

උහුමීය මානසික පුනුරුත්ථාපන ඒකකයේ වෛද්‍ය සුනේත්‍රා අබේසිංහ සහ වෛද්‍ය දීපා දිසානායක යන මහත්මීන් විසින් අප බාලිකා නිවාසයේ දියණියන් සඳහා උපදේශන වැඩසටහනක් පැවැත්විය. තමන්ගේ ඉදිරි අනාගතයට සාර්ථක ලෙස මුහුණ දෙන ආකාරය පිළිබදව මෙහිදී උපදෙස් ලබා දුනි.

**2024.07.14**

ස්පුට්නික් බාලිකා නිවාසයේ පුස්තකාල ළමා සමාජය මගින් පළමු වරට සිදු කරන ලද පැළ සිටුවීමේ වැඩසටහන ශ්‍රී සුමනසාර විදුහල් ක්‍රීඩානංගයේදී පැවැත්වුණි. ඒ සඳහා පුස්තකාල ළමා සමාජයේ සාමාජිකයන් සහ ස්පුට්නික් කාර්යමණ්ඩලය එක් විය.





**2024.07.15**

අප බාලිකා නිවාසයේ දියණියන් හට සෑම ඉරිදා දිනකම ෂග ඒ වසන්ත හේරත් ගුරුතුමා විසින් චිත්‍ර පංති පැවැත්වේ. මෙදින, පරිසරයේ ඇති ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කරගෙන නිර්මාණ සිදු කරන ලදී.





@manojmalaka

**2024.07.23**

ස්පුට්නික් බාලිකා නිවාසයේ ඇති හරිත ශක්ති පුහුණු අධ්‍යාපන මධ්‍යස්ථානය (GE –TEC) නැරඹීමට ජපානයේ සිට පිරිසක් පැමිණියහ.






**2024.08.08**

ස්පුට්නික් බාලිකා නිවාස පරිශ්‍රයේ සැලූන් සුබානි නමින් රූපලාවන්‍යාගාරයක් විවෘත කරන ලදී. මෙම අවස්ථාව සඳහා ජපන් තානාපතිතුමාගේ බිරිඳ වන මරිකො මහත්මිය, පරිවාස නිධාරින් සහ ස්පුට්නික් කාර්යමණ්ඩලයද සහභාගි විය. අප දියණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම මෙහි අරමුණ වේ.







**2024.08.09**

ජනාධිපති බාලිකා විද්‍යාලයේ ශිෂ්‍යාවකගේ දෙමාපියන් විසින් අප දියණියන් හට සපත්තු රැගෙන දෙන ලදී. ඔවුන් විසින් සවස තේ වේල ලබා දී කුරුණෑගල ඇතුගල් විහාරය වැඳ පුදා ගැනීමටද අප දියණියන් කැටුව යන ලදී.

**2024.08.10**

ජනාධිපති බාලිකා විද්‍යාලයේ බාලදක්ෂ ප්‍රජා සේවා ව්‍යාපෘතිය මගින් අප ස්පුට්නික් බාලිකා නිවාසයේ දියණියන් හට සපත්තු ලබා දීම සහ බාලිකා නිවාස පරිශ්‍රයේ මිරිස් පැළ සිටුවීම සිදු කරන ලදී.

@manojmalaka

**2024.08.11**

**"White Canvas" චිත්‍ර තරගාවලියට තම චිත්‍ර ඉදිරිපත් කිරීම සඳහා අප දියණියන් සූදානම් වන ආකාරය.**





2024.08.18

**ස්පුට්නික් බාලිකා නිවාසය වෙත පරිත්‍යාග සිදුකරන අජිත් මහතා සහ ඔහුගේ පවුලේ අය විසින් සංවිධානය කරන ලද ත්‍රිකුණාමලය චාරිකාව සඳහා අප බාලිකා නිවාසයේ දියණියන් හා කාර්යමණ්ඩලයද සහභාගි විය. එහිදි උණුවතුර ළිං, ත්‍රිකුණාමලය නාවික කඳවුර සහ මාබල් වෙරළ තීරය යන ස්ථාන නැරඹීමට හැකි විය.**



**2024.08.21**

**ඩෙන්මාර්ක් සිට පැමිණි තරුණියන් සිව් දෙනෙකු ස්පුට්නික් බාලිකා නිවාසයේ ස්වේච්ඡා සේවය සඳහා පැමිණියහ.**





@manojmalaka

**2024.08.24**

සකුකි වෛද්‍ය ආයතනයේ වෛද්‍ය සමන් කුමාර කිතලවආරච්චි මහතා සහ වෛද්‍ය කාංචනා සංජීවනි ජයලත් මහත්මිය විසින් අප දියණියන් සඳහා දන්ත සායනයක් පවත්වන ලදී.

තවද එදිනම ස්පුට්නික් බාලිකා නිවාසයේ පුස්තකාලය වෙත පොත් පරිත්‍යාගයක්ද සිදු කරන ලදී.





**2024.08.25**

දත් පරික්ෂාවෙන් පසුව දත්වල ගැටලු ඇති දියණියන්ව අදාල ප්‍රතිකාර සඳහා සකුකි වෛද්‍ය ආයතනය වෙත කැටුව යන ලදී.






@manojmalaka

**2024.08.26**
**ස්පුට්නික් බාලිකා නිවාසය නැරඹීම සඳහා ජපන් මිතුරු මිතුරියන් පිරිසක් පැමිණියහ.**





"Sputnik Girls' Home Newsletter" හි **එකොළොස්වන වෙළුම තුළින් නැවත හමුවෙමු. ඔබ සැමට නිදුක් නිරෝගී සුව, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු !!!**

**for Donations** ☞ [https://sputnik.lk/365]


**037-222-8965**

**donations@sputnik.lk**
**www.sputnik.lk**

**Sputnik Girls' Home,**
**Kanumale, Uhumeeya,**
**Kurunegala.**


@manojmalaka